කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී උපාධි තෙවන වසර පරීක්ෂණය** (විශේෂ උපාධි)

දෙවන සෙමෙස්තරය - 2016/2017

**SLG 3257- සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍ය (ද්විතීය තරංගය)**

(පැ දෙකයි)

**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

1. අ. පහත සඳහන් පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

I. ළ ඳු න් කැකුළු තන පට බැම්මකින් යුතේ
එ ව න් දගේ සිට දුටුවන් ද බැඳ ලතේ
මෙයින් මිදීමෙන් පැලඹුම් ලැබුණ හොතේ
සෙ දින් මෙමුළු ලොව වුව බැඳ ලතී සිතේ

II. සි සී වතට කිව කිවි දන කියති සි සී
නො සී කරනු ඉන් නිලු'පුල නෙතට නි සී
ලැසී ගමන් වත හස ගමන පසු බ සී
ප සී පසින් වැඩි සැර ලති ලියෝ නි සී (මයූර සන්දේශය 118,119 ගී)

III. සුරපුර මෙන් බැබැළී
එපුරෙහි සව් සිරින් දිළි
නුවරුන් නොවී මැළි
වෙළඳු දැක ඒ කෙළින සැණකෙළි

IV. රිසි රිසි දෙයැ'ර ගෙන
නොයෙක් ලෙස සැරසී ගෙන
නුවරුන් එක්ව ගෙන
තුමු ද සැණකෙළියට පටන් ගෙන

V. වෙන වෙණැ'දුරකු බල
නැසී ද තෝ මූසිල
බරණැස් පුර මෙකල
වෙසේ ගඳඹෙක් නමින් ගුත්තිල

VI. කියනු කිම මහිමා
එ ඇදුරු ගඳඹ මහිමා
අව පන්සිළු තමා
තමා අතවැසි කරනු නියමා (ගුත්තිල කාව්‍යය 130,131,149,150 ගී)

VII. හිමි දැකුමැ යුහුසුලු
අඟනක් මෙවුල මිණිනලු
බැඳ තනපට පුළුලු
නිතඹ හර බැඳ ගියා සිත්කලු (කාව්‍යශේඛරය 6:52)

VIII. පිරිමිනුඳු පතන
අවසර කල් රහස් තැන
මිස නො ලැබෙන සෙයින
ගැහැනු කවුරුද වරද නොබැඳෙන

IX. දෙතිස් කුණු ඇති වත්
සත ගත ඇලුම් නො හරිත්
එබැවින් වරදැතත්
පරණ පුරුදු වූ ලිය ම යහපත්

X. එ මේ දන්වාලිය
ගමනින් සදිසි නාලිය
ගෙන්වා බැමිණි ලිය
ඉසුරු මෙ තෙපුල් යළි කියා ලිය (කාව්‍යශේඛරය 13: 4 -6)

2. ''මයූර සන්දේශ කවියා නිර්මාණය කර ඇති නව කවි සිතුවිලි නිසා සහෘදයා ස්වභාව ලෝකයේ සුන්දරත්වය කෙරේ වඩාත් ආසක්ත වේ.'' සනිදර්ශන විග්‍රහයක යෙදෙන්න.

3. කෝට්ටේ යුගයේ රචනා වූ සන්දේශ කාව්‍යයක් ඇසුරෙන් එම කාව්‍ය සම්ප්‍රදායේ ප්‍රධාන ලක්ෂණ කවියා ස්වභාව සෞන්දර්ය වර්ණනයෙහිලා යොදා ගත් අයුරු සනිදර්ශනව පැහැදිලි කරන්න.

4. ''කාව්‍යශේඛරය සහෘදයන්ගේ සිත්හි වඩාත් රැඳී සිටින්නේ ස්ත්‍රී පුරුෂයන් අතර ඇතිවන සනාතන ගැටලුවක් කෙරේ කවියා දැක්වූ සානුකම්පිත දෘෂ්ටියයි'' සාකච්ඡාවක යෙදෙන්න.

5. ''ජාතක කතා කවියට නැගීමේ සම්ප්‍රදාය පොදු ජනයා අතර ජනප්‍රිය වීමට ගුත්තිල කාව්‍යය හේතු විය.'' මෙම ප්‍රකාශය පිළිබඳ ප්‍රමාණාත්මක විග්‍රහයක යෙදෙන්න.

***   ***   ***   ***   ***